# මූලික පිරිවෙන් පළමුවාර පරීක්ෂණය - 2019

## 03 ශ්‍රේණිය / Grade 03

| | | | | | |
|---|---|---|---|---|---|
| ඉතිහාසය | - I, II | | කාලය | : | පැය තුනයි. |
| History | - I, II | | Time | : | 03Hours |

### ඉතිහාසය - I

**උපදෙස්**

- **මෙම කොටස ප්‍රශ්න 20 කින් සමන්විත වේ.**
- **එය එක් එක් ප්‍රශ්නයට වරණ හතර බැගින් දී ඇත. නමුත් නිවැරදි පිළිතුර වන්නේ එක් වරණයක් පමණි. එම නිවැරදි වරණය තෝරා දී ඇති උපදෙස් අනුව පිළිතුර පත්‍රයෙහි ලකුණු කරන්න.**
- **මෙම කොටසට ලකුණු 40 ක් හිමිවේ.**

**01.** "ඉතිහාසයේ පියා" ලෙස හඳුන්වනු ලබන්නේ කවුරුන්ද?

**(1)** මහත්මා ගාන්ධි  **(2)** ඩියඩෝරස්
**(3)** හෙරඩෝටස්  **(4)** සෙනරත් පරණවිතාන

**02.** "ඉතිහාසය එක් විෂයයක් නොව විෂයයන් සියල්ල අන්ර්ගත ගෘහයයි." මෙම නිර්වචනය ඉදිරිපත් කළ ඉතිහාසඥයා වන්නේ,

**(1)** ජී. එච්. ට්‍රෙව්ලියන්  **(2)** පොලිබියස්
**(3)** ශ්‍රී ජවහර්ලාල් නේරු  **(4)** ඊ. එච්. කාර්

**03.** රටක ශ්‍රී විභූතිය පෙන්නුම් කරන සාධක වලට අයත් නොවන අංගයකි,

**(1)** භාෂාව  **(2)** සෞන්දර්යය
**(3)** සාහිත්‍ය  **(4)** වත් පොහොසත්කම්

**04.** මහානාම හිමි රචනා කළ මහාවංසයේ ප්‍රධාන වීර චරිතය බවට පත්කොට තිබෙනුයේ,

**(1)** වළගම්බා රජතුමා  **(2)** දුටුගැමුණු රජතුමා
**(3)** ධාතුසේන රජතුමා  **(4)** මහා පරාක්‍රමබාහු රජතුමා

**05.** කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ප්‍රදේශයේ පිහිටා ඇති ප්‍රාග් ඓතිහාසික ස්ථානය වන්නේ මින් කුමක්ද?

**(1)** බටදොඹලෙන  **(2)** අළුලෙන
**(3)** බෙලි ලෙන  **(4)** පාහියන්ගල ලෙන

**06.** ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණය නිවැරදිව දැක්වෙන වර්ග කිලෝමීටර් ප්‍රමාණ වන්නේ,

**(1)** වර්ග කිලෝමීටර් 45310 කි.  **(2)** වර්ග කිලෝමීටර් 75610 කි.
**(3)** වර්ග කිලෝමීටර් 65610 කි.  **(4)** වර්ග කිලෝමීටර් 50355 කි.

**07.** සමනල කන්දෙන් ආරම්භ වී වර්තමාන දකුණු පලාතෙන් මුහුහුදට ගලා බසින ප්‍රධාන ගංගාවකි,

**(1)** මහවැලි ගඟ  **(2)** වළවේ ගඟ
**(3)** කැළණි ගඟ  **(4)** ගිං ගඟ

**08.** දේශීය වශයෙන් තමාට එල්ල වූ තර්ජන මැඩපවත්වා ගැනීමට දකුණු ඉන්දියාවෙන් කුලී හමුදා ආධාර ලබාගත් පළමු ලාංකික පාලකයා,

**(1)** අභයනාග **(2)** මානවම්ම **(3)** පළමු මුගලන් **(4)** ඉලනාග

**09.** ශ්‍රී ලංකාව පුරාම ඒකීය පාලන ක්‍රමයක් ඒකීය සංස්කෘතියක් ඇතිවීමට ඉවහල් වූ ප්‍රධාන භෞතික සාධක වන්නේ,

**(1)** දූපතක් වීම. **(2)** විශාල රටක් වීම.

**(3)** රට මැද කඳුකරයක් වීම. **(4)** කුඩා දිවයිනක් වීම.

**10.** මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාවේ ඉදි වූ ප්‍රථම ඓතිහාසික ස්තූපය වන්නේ,

**(1)** රුවන්වැලි සෑය **(2)** අභයගිරිය

**(3)** ථූපාරාමය **(4)** ලංකාරාමය

- **අංක 11 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැලෙපේ. එම නොගැලපෙන නමට අදාළ අංකය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

**11.** **(1)** මාන්කුලම් **(2)** පොම්පරිප්පු **(3)** ඉරණමඩු **(4)** හේවාහැට

**12.** **(1)** වළවේ ගඟ **(2)** කිරිඳි ඔය **(3)** කාවේරි ගඟ **(4)** මැණික් ගඟ

**13.** **(1)** දීපවංසය **(2)** මහාවංසය **(3)** බෝධි වංසය **(4)** හරිවංසය

**14.** **(1)** අනුරාධගාම **(2)** දීපගාම **(3)** උරුවේලගාම **(4)** උපතිස්ස ගාම

**15.** **(1)** පණ්ඩු **(2)** පාරින්ද **(3)** තිරිතර **(4)** පනයමාර

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල පද යුගල හතර බැගින් ලබාදී ඇත. ඒවා අතුරෙන් එක් පද යුගලයක පද එකිනෙකට නොගැළපේ. නොගැළපෙන පද යුගලය තෝරා අදාළ අංකය පිළිතුර පත්‍රයෙහි ලකුණු කරන්න.**

**16.** **(1)** පේදුරු තුඩුව - උතුරු පළාත **(2)** කොළඹ - බස්නාහිර පළාත
**(3)** දෙවුන්දර - දකුණු පළාත **(4)** සංගමන් කන්ද - වයඹ පළාත

**17.** **(1)** පණ්ඩුකාභය - දීඝගාමිණි **(2)** දුටුගැමුණු - කාවන්තිස්ස
**(3)** වළගම්බා - සද්ධාතිස්ස **(4)** මහසෙන් - ධාතුසේන

**18.** **(1)** රාමගෝණ - මහවැලි ගං මෝය අසල **(2)** දීඝායුගාම - ගල්ඔය අසල
**(3)** උපතිස්සගාම - කැළණි ගඟ අසල **(4)** කාචරගාම - මැණික් ගඟ අසල

**19.** **(1)** වෘක්ෂ වන්දනාව - බෝධි වන්දනා **(2)** මලවුන් පිදීම - යාග පැවැත්වීම
**(3)** පර්වත වන්දනා - ස්තූප වන්දනා **(4)** ගිනි පූජා - පහන් පූජාව

**20.** **(1)** වසභ රජතුමා - මහවිලච්චි වැව **(2)** මහසෙන් රජතුමා - මින්නේරි වැව
**(3)** ධාතුසේන රජතුමා - කලා වැව **(4)** දුටුගැමුණු රජතුමා - නාච්චිදූව වැව

# මූලික පිරිවෙන් පළමුවාර පරීක්ෂණය - 2019

## 03 ශ්‍රේණිය / Grade 03

ඉතිහාසය - I, II
History - I, II

**ඉතිහාසය - II**

**උපදෙස්**

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතතුරු සපයන්න.**
- **මෙම කොටසට ලකුණු 60 ක් හිමිවේ.**

**01. (i)** ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කර නම් කරන්න.

**1.** මල්වතු ඔය **2.** යාපනය **3.** පොළොන්නරුව

**4.** කතරගම **5.** මහනුවර **6.** දෙවිනුවර (ලකුණු 1 × 6 = 6)

**(ii)** පහත දී ඇති රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



**A** රූපය

(අ) මෙහි රූපයේ දැක්වෙන ස්තූපය කුමක්ද?

(ආ) එය ගොඩනැගූ රජතුමා කවරෙක්ද?

(ඉ) එම ස්තූපය පිහිටා ඇති ඓතිහාසික නගරය කුමක්ද?

(ලකුණු 1 × 3 = 3)



**B** රූපය

(අ) රූපයේ දැක්වෙන වැව කුමක්ද?

(ආ) මෙම වැව කුමන යුගයට අයත් වේද?

(ඉ) එය කුමන රාජ්‍ය සමයේ කරවූ නිර්මාණයක්ද?

(ලකුණු 1 × 3 = 3)

**02. (i)** ඉතිහාසය හැදෑරීමේදී වැදගත් වන දේශීය සාහිත්‍යය මූලාශ්‍ර **දෙකක්** නම් කරන්න.

**(ii)** ඉතිහාසය හැදෑරීමෙන් ලැබෙන ප්‍රයෝජන **හතරක්** ලියන්න.

**(iii)** ඉතිහාසය හැදෑරීමෙන් ඔබ තුළ වර්ධනය වන ගුණාංග **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 4 + 6 = 12)

**03. (i)** ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීමේ ලක්ෂණ **දෙකක්** ලියන්න.

**(ii)** ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරයේ පිහිටා ඇති භූ ලක්ෂණ **දෙකක්** ලියන්න.

**(iii)** ශ්‍රී ලංකාවේ බාහිර භූගෝලීය ලක්ෂණ ඉතිහාසය හැඩගැස්වීමට බලපෑ ආකාරය කරුණු **දෙකක්** යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 2 + 4 + 6 = 12)

**04.** **(i)** ශ්‍රී ලංකාවට පැමිණි භාරතීය ජන කණ්ඩායම් **දෙකක්** නම් කරන්න.

**(ii)** භාරතීය ජන කණ්ඩායම් පිහිටුවා ගත් ජනපද **හතරක්** නම් කරන්න.

**(iii)** භාරතීය ජන කණ්ඩායම් ජනාවාස පිහිටුවීම සඳහා ගංගා නිම්න තෝරා ගැනීමට බලපෑ හේතු **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු** 2 + 4 + 6 = 12)

**05.** **(i)** මිහිඳු මහ රහතන් වහන්සේ සමග මෙරටට වැඩම කළ ධර්මදූත කණ්ඩායමේ සිටි රහතුන් වහන්සේලා **දෙනමක්** නම් කරන්න.

**(ii)** මිහිඳු මහ රහතන් වහන්සේ වැඩම වීමට පෙර මෙරට සමාජයේ පැවති ආගම් විශ්වාස හා ඇදහිලි **හතරක්** නම් කරන්න.

**(iii)** මහින්දාගමනයෙන් ලාංකිකයන් ලද දායාද කරුණු **දෙකක්** යටතේ පැහැදිලි කරන්න.

**(ලකුණු** 2 + 4 + 6 = 12)

**06.** **(i)** වළගම්බා රජතුමා මුහුණ දුන් අභියෝග **දෙකක්** සඳහන් කරන්න.

**(ii)** වළගම්බා රජතුමාට උපකාර කළ භික්ෂූන් වහන්සේලා **දෙනමක්** නම් කරන්න.

**(iii)** වළගම්බා රජ සමයේ ආගමික වැදගත්කම කරුණු **දෙකක්** යටතේ කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු** 2 + 4 + 6 = 12)

**07.** **(i)** වසභ රජතුමාගේ පාලන කාලය පිළිබඳ තොරතුරු ලබාගත හැකි සෙල්ලිපි **දෙකක්** නම් කරන්න.

**(ii)** වසභ රජතුමාගේ පාලන සමයේ ප්‍රාදේශීය පාලනයට සම්බන්ධව සිටි ඇමතිවරු **දෙදෙනෙකු** නම් කරන්න.

**(iii)** වසභ රජතුමා ආර්ථික කටයුතු දියුණු කිරීමට සිදුකළ සේවය කරුණු **දෙකක්** යටතේ පැහැදිලි කරන්න. **(ලකුණු** 2 + 4 + 6 = 12)

***